(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 407.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 නොවැම්බර් මස 01 වැනි සෙනසුරාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3400/'13

1.

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ රාත්‍රී මෝටර් රථ ධාවන තරග සංකල්පය ආරම්භ වූයේ කවර දිනයකදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2011 සහ 2012 වර්ෂවල කොළඹදී පැවැත්වූ රාත්‍රී මෝටර් රථ ධාවන තරගවලට අදාළව,

(i) එහි මධ්‍යම සංවිධායක පාර්ශ්වය කවරේද;

(ii) ධාවන තරග පැවැත්වූ දිනයන් කවරේද;

(iii) එක් ධාවන තරගයක් සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(iv) සාමාන්‍ය ජනතාවට ඉන් අත්වූ ප්‍රතිලාභ කවරේද;

(v) ජනනය කොටගත් ආදායම හා ඉපැයූ විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(vi) රජය විසින් කොළඹ මහ නගර සභාවට ලබා දුන් මුදල් ප්‍රමාණය කොපමණද;

(vii) සාමාන්‍ය ජනතාවට කිසියම් අපහසුතාවක් සිදු වූයේද;

(viii) අනතුරු හෝ තුවාල ලැබූවන් වාර්තා වී තිබේද;

(ix) එසේ නම්, තුවාල ලැබූ පුද්ගලයින්ගේ තත්ත්වය හා ඔවුන්ට ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉදිරියේදීත් රාත්‍රී මෝටර් රථ ධාවන තරග පවත්වන්නේද;

(ii) එය රටේ ප්‍රමුඛතාවයක් නම්, එයට යොදවන මුදල රටේ වෙනත් සංවර්ධන කටයුතු සඳහා යොදා ගත නොහැක්කේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4090/'13

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු පළාතේ තෝරා ගත් රජයේ පාසල්වල දරු දැරියන් සඳහා දිවා ආහාර සපයනු ලබන බව දන්නේද;

(ii) දිවා ආහාරය ලබාදීම සඳහා පාසල් තෝරා ගැනීමට යොදාගත් නිර්ණායක කවරේද;

(iii) පාසල් දිවා ආහාර සඳහා යොදාගනු ලබන ආහාර වට්ටෝරුව සකස් වී ඇති ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පාසල් දිවා ආහාරය සපයනු ලබන සැපයුම්කරුවන්ට පසුගිය මාස ගණනාවක සිට මුදල් නොලැබීම නිසා ඔවුන් දැඩි මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ පා ඇති බව දන්නේද;

(ii) එම මුදල් නොගෙවීමට හේතු කවරේද;

(iii) දිවා ආහාර සැපයුම්කරුවන්ට කඩිනමින් මුදල් ගෙවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5086/'14

3.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය, කණ්ඩාවලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුරසුමෝට්ටෙයි ග්‍රාම නිලධාරී වසමට අයත්, පලෙයකම්ම්, මුරසුමෝට්ටෙයි, සේට්ටෘක්කණ්ඩි - පළමුවැනි අදියර සහ අයියෙන්කෝවිලඩි යන ප්‍රදේශවල පවුල් 300ක් පමණ ජීවත් වන බවත්;

(ii) එම ජනතාව නැවත පදිංචි කර අවුරුදු 4ක් සම්පූර්ණ වී ඇතත්, මේ දක්වා එම ප්‍රදේශයේ කිසිදු සංවර්ධනයක් සිදු නොකර, නොසලකා හැර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අයියෙන්කෝවිලඩි ගම්මානයට පිවිසෙන මාර්ගයේ ඇති දැව පාලම මේ වන විට අනතුරුදායක තත්ත්වයට පත්ව තිබෙන බැවින් එය ප්‍රතිසංස්කරණය කර දීමටත්;

(ii) මේ දක්වා විදුලි බලය ලබා දී නොමැති එම ගම්මානයට විදුලිය ලබා දීමටත්;

පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5097/'14

4.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැයට කිරුළ 2014 ප්‍රදර්ශනයට සමගාමීව වයඹ පළාත තුළ දියුණු කරන ලද සුළු වාරිමාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රදර්ශනයට සමගාමීව අලුතින් ඇති කරන ලද වාරිමාර්ග ව්‍යාපෘති තිබේද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වැය කළ මුදල් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5147/'14

5\.

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ජාතික විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරිස අතරින් නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) සෑම සරසවි සිසුවෙකුටම නේවාසිකාගාර පහසුකම් ලබා දීමට පියවර ගන්නා බවට මහින්ද චින්තනයෙන් සහ වර්ෂ 2010 දී මහින්ද චින්තන ඉදිරි දැක්ම මගින් පොරොන්දුවක් ලබා දී ඇති බව දන්නේද;

(iv) එම පොරොන්දුව යථාර්තයක් බවට පත් කිරීම සඳහා වර්ෂ 2006 සිට 2013 දක්වා කාල සීමාව තුළ දී ගෙන ගිය වැඩපිළිවෙළ කවරේද;

(v) සෑම සරසවි සිසුවෙකුටම නේවාසිකාගාර පහසුකම් ලබා දීමේ අරමුණ වෙත ළඟාවීම සඳහා එම වැඩපිළිවෙළ ප්‍රමාණවත් වී නොමැති බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අ(iii) හි සඳහන් පොරොන්දු පරිදි නේවාසිකාගාර නොලැබුණු සිසුන්ට එම පහසුකම් ලබා දෙන තෙක් අවම වශයෙන් රුපියල් දෙදහසක (රු. 2000/=) මාසික දීමනාවක් ලබා දීම කෙරෙහි අවධානය යොමු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5181/'14

6\.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2009 සිට 2014 දක්වා කාල සීමාව තුළ දී,

(i) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මගින් අනුග්‍රාහක දැන්වීම්, සුබ පැතුම් පුවරු සහ ප්‍රචාරක පුවරු සවි කිරීම වෙනුවෙන් වැය කළ මුදල;

(ii) එකී ආයතනයන්හි අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් සවි කරන ලද පුවරු සඳහා වැය කළ මුදල;

(iii) එකී ආයතනයන්හි අරමුණුවලට පරිබාහිර අරමුණු වෙනුවෙන් සවිකරන ලද පුවරු සඳහා වැය කළ මුදල;

වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනයන්හි අරමුණුවලට පරිබාහිර අරමුණු වෙනුවෙන් සවි කරන ලද ප්‍රචාරක පුවරු මගින් ප්‍රචාරය කරන ලද කරුණු කවරේද;

(ii) එම පුවරු සවි කිරීම සඳහා අනුමතිය ලබා දුන් අය කවුරුන්ද;

(iii) ඒ සඳහා වූ වියදම ප්‍රතිපූරණය කර ගත් ආකාරය කවරේද;

(iv) එකී පුවරු සඳහා කරන ලද ගෙවීම්වලට අදාළ ලේඛන ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5193/'14

7\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇඹිලිපිටිය කඩදාසි කම්හල මේ වන විට රජයට අයත් ආයතනයක් වන්නේද;

(ii) එම ආයතනයේ කොටසක හිමිකම රජය සතුවේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(iii) එම කම්හල මේ වන විට විදේශීය ආයෝජනයක් තුළින් පෞද්ගලීකරණයට ලක්වී ඇත්නම්, එම ආයෝජකයින් විසින් ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන සපයාගෙන ඇති ආකාරය කවරේද;

(iv) එම ආයෝජකයාගේ නම කවරේද;

(v) එම ආයෝජකයා විසින් දේශීය බැංකුවකින් ලබා ගත් ණය මුදලකින් එම ආයෝජනයට අදාළ මුදල පියවා ඇති බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කඩදාසි කම්හලට මුදල් ආයෝජනය කළ සමාගමක් වේ නම්, එම ආයෝජනයට අදාළව එකී සමාගම විසින් තවදුරටත් රජයට ගෙවිය යුතු මුදලක් තිබේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5271/'14

8\.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාවනැල්ල, මහවත්ත, දනාගම පාර, අංක 4 සී / 12 දරන ස්ථානයේ පදිංචි, එම්. එල්. ෆාතිමා රිසානා මහත්මියගේ ස්වාමි පුරුෂයා වන, අහමදු ලෙබ්බේ අසීස් මහතා (ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර අංක N0628701) සෞදි අරාබියාවේ, රියාද් නගරයේ දී 2012.07.09 දින මියගිය බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මියගිය අසීස් මහතා වෙනුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියෝජිතායතනයේ අංක 00884/2013 යටතේ රක්ෂණ වන්දි අයදුම් පත්‍රයක් සමග අදාළ ලිපි ලේඛන සහ දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබුවත්, මෙතෙක් එම රක්ෂණ වන්දි මුදල් ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම වන්දි මුදල් අසීස් මහතාගේ බිරිඳ වෙත නොපමාව ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5417/'14

9\.

ගරු අජිත් කුමාර මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුතුරාජවෙල අභයභූමියේ සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම අභයභූමියට ආවේණික ජීව විශේෂ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ජීවීන් අතරින් ඒක දේශික ජීවීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් මුතුරාජවෙල අභය භූමියට අයත් ප්‍රදේශයෙන් අක්කර 150ක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබේද;

(ii) මේ වන විට අදාළ අක්කර 150 කිසියම් ආයතනයකට පැවරීමට නියමිතව තිබේද;

(iii) මෙම ආයතනය අදාළ භූමියේ සිදු කිරීමට නියමිත ව්‍යාපෘතිය කවරේද;

(iv) එම ව්‍යාපෘතිය මගින් සිදු වන පරිසර හානිය කවරේද;

(v) අදාළ පරිසර හානිය නිසා ඇති වන ගැටලු සම්බන්ධයෙන් ලබා දෙන විසඳුම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3438/'13

10\.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වන විට ක්‍රියාත්මකව පවත්නා සියලු ඍජු සහ වක්‍ර බදු වර්ග කවරේද;

(ii) අද වන විට පවත්නා අනුපාත අනුව බද්දෙහි බලපෑමෙහි රුපියල් අගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) සහල්, සීනි, පරිප්පු, කිරිපිටි, තිරිඟු පිටි, පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ටින් මාලු, ලූනු, විදුලි බලය සහ බැංකු ණය මත අද වන විට පනවා ඇති සියලු බදු ප්‍රමාණයන් කවරේද;

(ii) 2004 අප්‍රේල් 02, 2005 දෙසැම්බර් 01, 2009 දෙසැම්බර් 01 සහ 2013 ජනවාරි 01 දිනයන්ට එම සංඛ්‍යාවන්හි සැසඳුම කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) අද වන විට පවතින අනුපාත අනුව බද්දෙහි බලපෑමෙහි සම්පත් වටිනාකම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4282/'13

11\.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නිවිතිවැල්බොක්ක ග්‍රාම නිලධාරී වසමේ, මහගේන ග්‍රාමයේ එච්. එම්. ප්‍රේමාවතී මහත්මියට අයත් අංක 891 දරන ඉඩම් කැබැල්ලේ තිබූ වර්ෂ සියයක් පමණ පැරණි පොදු ළිඳ එම තැනැත්තිය විසින් වසා දමා ඇති බවත්;

(ii) එම ළිඳ වැසීම නිසා ඇතිවූ ආරවුල නිවිතිවැල්බොක්ක ග්‍රාම නිලධාරී විසින් අසත්‍ය තොරතුරු සැපයීම නිසා විසඳීමට නොහැකිවී ඇති බවත්;

(iii) යූ. ජී. අනෝමා කාන්ති මහත්මිය ඇතුළු ගම්වැසියන් පිරිසක් ඉහත පොදු ළිඳ වැසීම සම්බන්ධයෙන් මැදිහත්වන ලෙස 2011 ජුනි මාසයේදී මාතර දිස්ත්‍රික් ලේකම්තුමාගෙන් ලිඛිතව ඉල්ලීමක් කර ඇති බවත්;

(iv) මේ සම්බන්ධයෙන් දකුණු පළාත් ඉඩම් කොමසාරිස් විසින් අංක ඉකොමා/ වැපි/පොදු 2011 හා 2011.08.03 දිනැති ලිපිය මගින් වැලිපිටිය ප්‍රාදේශීය ලේකම්ගේ නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තාවක් කැඳවා ඇති බවත්;

(v) 2011.09.13 දින ආරවුලට සම්බන්ධ පුද්ගලයින් කැඳවා ස්ථානීය පරීක්ෂණයක් සිදුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී ළිඳ නැවත පොදු පරිහරණයට යොදා ගැනීමට හැකිවන පරිදි ළිඳ පිහිටි භූමිය රජයට පවරාගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5098/'14

12.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තල ගොවීන් තල අස්වනු සැකසීමේ දී විවිධ දුෂ්කරතාවලට මුහුණ පාන බව දන්නේද;

(ii) පසුගිය වර්ෂ තුන තුළ මෙරට තල නිෂ්පාදනය කොපමණද;

(iii) එම කාල සීමාව තුළදී අපනයනය කළ තල ප්‍රමාණය සහ එහි වටිනාකම කොපමණද;

(iv) තල අස්වැන්න වැඩි කර ගැනීම සඳහා දේශීය වශයෙන් තල බීජ නිෂ්පාදනයට පියවර ගෙන තිබේද;

(v) තල අස්වැන්න සැකසීම සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීමේ ක්‍රමවේදයන් හඳුනාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු සිල්වෙස්ත්‍රි අලාන්ටින් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත (2015) — (හත්වැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 ඔක්තෝබර් 24) [1]

*2.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 අගෝස්තු 07) [1]

*3.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*9.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවි අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*12.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*13.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*14.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.01.21 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.04.24 දින සලකා බලන ලදී.)

*15.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*16.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*17.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*18.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*19.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*20.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*21.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2011,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*22.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2011,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරිය පනතේ 34(2) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*23.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*24.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව - 2011,— 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 27 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*25.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

26.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

27.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

28.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

29.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

30.

කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

31.

සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

32.

පී. හැරිසන් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

33.

මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

34.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.